www.agaram.lk

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 6 ශ්‍රේණිය
## නැටුම් (දේශීය)

**නම/විභාග අංකය :-** ........................................................................... **කාලය : පැය 02 යි.**

### I කොටස

ප්‍රශ්න අංක 1 - 10 දක්වා දී ඇති ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. ''ජේලි ගැසී අඟනෝ සැරසීලා ...'' යන කවිය.
   1. ලී කෙළි කවියකි. 2. නැලවිලි කවියකි. 3. සවරම් කවියකි. 4. කළගෙඩි කවියකි.

2. ''පරිසරයේ අසිරිය''යන තේමාව නිර්මාණයේදී සුදුසු චරිත කිහිපයක් වන්නේ
   1. මුවපොව්වන්, සා පැටවුන් 2. ඉර, සුළඟ, ගස්වැල්
   3. ගංගා, ඇල දොළ, දියඇලි 4. මේ සියලුම චරිත

3. මින් සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩයක් නො වන්නේ,
   1. ටොනික් පියන් වළල්ල 2. පන්තේරුව
   3. තම්මැට්ටම 4. දවුල

4. ශ්‍රී ලංකාවේ දකුණු මුහුදුබඩ පළාත්වල ප්‍රචලිත නර්තන සම්ප්‍රදාය වනුයේ
   1. උඩරට නැටුම් සම්ප්‍රදාය යි. 2. පහතරට නැටුම් සම්ප්‍රදාය යි.
   3. සබරගමු නැටුම් සම්ප්‍රදාය යි. 4. භරත නැටුම් සම්ප්‍රදාය යි.

5. මුල් යුගයේ වන්නම් රචනා වී ඇත්තේ
   1. ගායනා සඳහා ය 2. නර්තනය සඳහා ය. 3. රංගනය සඳහා ය. 4. නාට්‍ය සඳහා ය.

6. සිංහල ලී කෙළි නැටුම හා සමාන ද්‍රවිඩ ගැමි නැටුමකි,
   1. සෙම්බු 2. සුලකු 3. ගොයම් 4. කෝලාට්ටම්

7. ''පාන්දරින් ඉස්කෝලෙට ටැන්ටු කරත්තෙන් ...'' යන ගීතයෙන් ප්‍රකාශ වන උපදේශයකි,
   1. සතුන් නොමැරිය යුතු බව. 2. කළගුණ සැලකිය යුතු බව.
   3. ගුරු දෙපා නැමදිය යුතු- බව. 4. දින පතා පාසල් යා යුතු බව.

8. විකල්ප වාද්‍ය භාණ්ඩයක් ලෙස තාල තැබීම සඳහා යොදා ගත හැක්කේ මින්,
   1. පොල්කටු දෙකක් 2. ගෙජ්ජි වැලක් 3. ටින් බෙරයක් 4. රබානක්

9. නර්තනයේ මූලික ඉරියව්ව,
   1. මණ්ඩියයි 2. කලාසමයි 3. මිටිරියනයි 4. දණ්ඩියයි



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

10. ගැටබෙරය ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස වාදනය කරන නර්තන සම්ප්‍රදාය වනුයේ

1. පහතරට නර්තන සම්ප්‍රදාය.
2. සබරගමු නර්තන සම්ප්‍රදාය.
3. භරත නාට්‍යම් සම්ප්‍රදාය.
4. උඩරට නර්තන සම්ප්‍රදාය.

(ලකුණු 2 බැගින් 2 x 10 = 20)

**ගැළපෙන ලෙස යා කරන්න.**

| | A | B |
|---|---|---|
| 11. | මගෙ පොඩි යාළු | සබරගමු නර්තනය |
| 12. | භක්ති ගීත | උඩරට නැටුම් |
| 13. | පබළු ඇඳුම් කට්ටලය | සාරධර්ම |
| 14. | මහනුවර, සත්කෝරළය | සුනිල් ආරියරත්න |
| 15. | නමස්කාරය | වෙසක් උත්සවය |

(ලකුණු 2 බැගින් 2 x 05 = 10)

**පහත දැක්වෙන හරස් පද යොදාගෙන ප්‍රෙහේලිකාව පුරවන්න.**




<u>හරහට</u>

16 2. පරිසරය ලස්සන කරන සතෙකි.
17 3 උදෑසන එළිය කරයි.
18 5. උණබටවලින් තනා ගන්නා විකල්ප වාදන භාණ්ඩයකි.
19 8. තාලය තැබීම සඳහා භාවිත කරයි.
20 10. වෙසක් උත්සවයේදී සමරනු ලබයි.

<u>පහළට</u>

21 1. පාද හුරුවීම සඳහා නටනු ලබයි.
22 4. කාන්තාවන් විසින් නටනු ලබන ගැමි නැටුමකි.
23 6 සම්ප්‍රදායික වාදන භාණ්ඩයකි.
24 7. ද්‍රවිඩ ගැමි නැටුමකි.
25 9. කාලයේ වේගය හඳුන්වන්නේ මේ නමිනි.

(1 × 10 = 10)

## II කොටස

**ප්‍රශ්න 3 ක් පමණක් තෝරා ගෙන පිළිතුරු සපයන්න.**

1. දේශීය නර්තන සම්ප්‍රදායන් පාඩම උපයෝගී කොට ගෙන පහත වගුව සම්පූර්ණ කරන්න.

| නර්තන සම්ප්‍රදාය | උඩරට | පහතරට | සබරගමු | |
|---|---|---|---|---|
| ප්‍රචලිත ප්‍රදේශ එකක් | 1. මහනුවර<br>2. ..................................... | 1. ............................<br>2. ගාල්ල | 1. රත්නපුරය<br>2 ............................ | ල. 6 |
| ප්‍රධාන වාද්‍ය භාණ්ඩය | | | | ල. 6 |
| ප්‍රධාන ශාන්තිකර්මය | | | | ල. 6 |
| ප්‍රධාන රංග වස්ත්‍රාභරණ කට්ටලය | | තෙල්මේ ඇඳුම් කට්ටලය | පබළු ඇඳුම් කට්ටලය | ල. 2 |

ල. 20



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

2. i. ගැමි නැටුමක ඇති ලක්ෂණ 2 ක් ලියන්න.

   ii. සිංහල ගැමි නැටුම් 4 ක් නම් කරන්න.

   iii. ඉන් එක් නැටුමකට අයත් කවියක් ලියන්න.

   iv. ද්‍රවිඩ ගැමි නැටුම් 2 ක් නම් කරන්න.

   v. ඉන් එක් ගැමි නැටුමක් පිළිබඳ වාක්‍ය 2 ක් ලියන්න. (ලකුණු 4 × 5 = 20)

3. i. සම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ 2 ක් නම් කරන්න.

   ii. විකල්ප වාද්‍ය භාණ්ඩ 2 ක් නම් කරන්න.

   iii. සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩයක ඇති ලක්ෂණ 2 ක් ලියන්න.

   iv. විකල්ප වාද්‍ය භාණ්ඩයක ලක්ෂණ 2 ක් ලියන්න.

   v. සාම්ප්‍රදායික හෝ විකල්ප වාද්‍ය භාණ්ඩයක රූප සටහනක් අඳින්න.

(ලකුණු 4 × 5 = 20)

**මෙම ප්‍රශ්නය සඳහා ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදාය අදාළ වන්නම තෝරා ගන්න.**

4 i. හනුමා වන්නම / හනුමන්තා තාලය / අනිලා වන්නමට අදාල තිත් රූප ලියන්න.

   ii. එහි බෙර පදය ලියන්න.

   iii. එම වන්නමේ එක් කවියක් ලියන්න.

   iv. එහි කස්තිරම / ඉරට්ටිය / කලාසම ලියන්න.

   v. ''වන්නම්'' පිළිබඳ වාක්‍ය 2 ක් ලියන්න. (ලකුණු 4 × 5 = 20)

5. පහත සඳහන් මාතෘකා 4 ක් තෝරා ගෙන ඒ පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න.

   1. සාරධර්ම  2. මණ්ඩිය

   3. නැළවිලි කවි  4. විකල්ප වාද්‍ය භාණ්ඩ  5. තෛපොංගල් උත්සවය

(ලකුණු 4 × 5 = 20)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk